ලංසු සඳහා ආරාධනයයි

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

හලාවත ධීවර වරායේ පරිපාලන ගොඩනැගිල්ලේ වහලය නවීකරණය කිරීම

කොන්ත්‍රාත් අංකය: CFHC/PD/RRAB/CHI/2026-90

01. "ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව" වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් ඉහත සඳහන් කාර්යය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම කාර්යයට කඩා දැමීමේ කටයුතු, ගලවා ඉවත් කිරීමේ කටයුතු, කොන්ක්‍රීට් වැඩ, බ්ලොක් ගල් සහ ගඩොල් බැඳීමේ වැඩ, පිරවුම් කටයුතු, ටයිල් ඇතිරීමේ වැඩ, ඇලුමිනියම් දෙර සහ ජනෙල් තැවත සවිකිරීම් සහ තීන්ත ගැමේ කටයුතු ආදිය ඇතුළත් වේ. අවිනිශ්චිත වියදම් සහ වැට් (VAT) බදු රහිතව ඉංජිනේරු ඇස්තමේන්තුවේ ආසන්න වශයෙන් පිරිවැය මිලියන 12.16 කි..

02. ජාතික තරගකාරී ලංසු ක්‍රමය මගින් ලංසු කැඳවේ

03. ලංසුකරු පහත සඳහන් යෝග්‍යතා නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.:

- ලංසුකරු අසාධු ලේඛනගත වූ අයෙකු නොවිය යුතුය.
- ලංසු ඉදිරිපත් කරන අවස්ථාව වන විට ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ C7, C6 හෝ C5 ශ්‍රේණියක් යටතේ CIDA හි ලියාපදිංචි වී තිබිය යුතුය.

04. ලංසුකරු පහත සඳහන් සුදුසුකම් නිර්ණායකයන්ට අනුකූල විය යුතුය:

- පසුගිය වසර පහ තුළ (2019, 2020, 2023, 2024, 2025) ඉටුකරන ලද ඉදිකිරීම් කර්මාන්තයන්ගේ සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 13.38 ක් විය යුතුය.

  පසුගිය වසර 10 ඇතුළත ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස මෙම කාර්යයට සමාන ස්වභාවයක් සහ සංකීර්ණත්වයක් ඇති කොන්ත්‍රාත්තු එකක පළපුරුද්ද තිබිය යුතුය (මෙම අවශ්‍යතාවය සපිරීම සඳහා, සඳහන් කර ඇති කාර්යයන්ගෙන් අවම වශයෙන් 70% ක් වත් තිම කර තිබිය යුතුය). වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 8.51 ක් විය යුතුය

- ව්‍යාපෘතිය අවසන් වන දිනය දක්වා, අනෙකුත් කොන්ත්‍රාත්තු වගකීම් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමට සිදුවන ඕනෑම අත්තිකාරම් මුදලක් හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ/හෝ ණය පහසුකම් ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් මිලියන 13.38 කට නොඅඩු විය යුතුය.

- ටෙන්ඩර් කළ හැකි අගය රුපියල් මිලියන 5 ඉක්මවන සෑම ලංසුවක් සඳහාම, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වැනි වගන්තියට අනුකූලව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලංසුකරු සතුව තිබිය යුතුය. මෙය කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකමකි.

05. මෙම ලංසුව සඳහා ඉදිකිරීම් කාලසීමාව ලිත් දින 60 ක් වන අතර පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ධීවර වරායේ ව්‍යාපෘතිය පිහිටා ඇත.

06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, 011-2529391 යන දුරකථන අංකය ඔස්සේ "ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15" හි පිහිටි සිවිල් ඉංජිනේරු අංශයේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉංජිනේරු) වෙතින් වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර, "ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15" හි පිහිටි කාර්යාලයේ දී ප්‍රසම්පාදන ලේඛන (නොමිලේ) පරීක්ෂා කර බැලිය හැක.

07. තැවත නොගෙවන ගාස්තුවරු. 3,500.00 ක් ගෙවීමෙන් අනතුරුව කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, වැ.බ. ප්‍රසම්පාදන කළමනාකරු වෙත ආයතනික ලිපි ශීර්ෂයක් යටතේ කරනු ලබන ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2026.09.08 සිට 2026.09.28 දක්වා ඕනෑම වැඩකරන දිනක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා, උනන්දුවක් ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

08. ලංසු 2026.12.14 දක්වා (දින 77ක්) වලංගු විය යුතුය.

09. සියලුම ලංසු සමඟ රුපියල් එක්ලක්ෂ අසූ පන්දහසක (රු. 185,000.00) වන ලංසු විවෘත කරනු ලබන දින සිට 2027.01.11 දක්වා (දින 105 ක්) වලංගු ලංසු ඇපකරයක් (බැංකු ඇපකරයක් හෝ ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුවක්) ඉදිරිපත් කළ යුතුය. මුදල් තැන්පත් පත්‍රිකාවේ පිටපතක් ලංසු සමග අමුණා එවිය යුතුය.

10. මුද්‍රා තැබූ ලංසු අනු පිටපතක් සහිතව, 2026.09.29 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15"** වෙත ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු බාරගැනීම අවසන් වූ වහාම, සහභාගී වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. (ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ).

11. පූර්ව ලංසු රැස්වීමක් 2026.09.18 දින පෙ.ව. 11.00 ට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15 රොක් හවුස් පටුමග, කොළඹ 15 හිදී පැවැත්වේ.

12. සියලුම ලංසුකරුවන් CIDA/SBD/01, දෙවන මුද්‍රණය, 2007 ජනවාරි (පෙර ICTAD/SBD/01) ලේඛනය සැලකිල්ලෙන් කියවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.